ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 30 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ප්‍රජා ශාලා 11 ක්, සුසාන භූමි 15 ක් හා ඉඩම් කැබලි 06 ක් වටිනාකම් හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබූ අතර, ස්ථාවර වත්කම් ලේඛනයේ ද සටහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගෙන තිබූ රු.79,070 ක් වටිනා කසළ කරත්ත 02 ක් හා ට්‍රැක්ටරයක් අලුත්වැඩියා කිරීම සඳහා වැය කර තිබූ රු.20,700 ක වටිනාකම යන්ත්‍ර හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක එකතු වටිනාකම රු.17,750,996 ක් වූ අතර, ඉන් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.739,078 ක් විය. අවුරුදු 01 ත් 05 ත් අතර කාලයට අදාළ හිඟ ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,222,019 ක් වූ අතර, 2018 ජූනි 30 දිනට රු.12,926,494 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

**2017 දෙසැම්බර් 31 දිනට රු.11,571,051 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකමින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.82,142 ක් විය. අවුරුදු 01 ත් 05 ත් අතර කාලයකට අදාළ ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,583,905 ක් වූ අතර, 2018 ජූනි 30 දිනට රු.4,614,788 ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.**

**1.3.3** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

---

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.80,455,811 ක් වූ ගිණුම් විෂයන් 02 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.4** අනුකූල නොවීම්

---

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 89,602,563 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | 747,478 | 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 42 කට අදාළව කර්මාන්ත අත රැඳවුම්, පරිත්‍යාග හා ඉකුත් චෙක්පත් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |

**2.** මූල්‍ය සමාලෝචනය

---

**2.1** මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,821,559 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,977,226 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

---

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

---

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,936,000 | 2,046,294 | 2,041,893 | 1,422,056 | 1,603,210 | 1,685,717 | 2,093,186 | 1,417,153 |
| (ii) | කුලී | 4,623,000 | 4,362,359 | 4,404,259 | 882,364 | 3,879,556 | 4,416,050 | 4,351,572 | 924,525 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,220,200 | 990,800 | 1,007,300 | 36,000 | 1,252,900 | 980,400 | 948,900 | 52,500 |
| (iv) | වෙනත් ආදායම් | 20,044,500 | 14,118,358 | 13,018,502 | 9,151,964 | 16,062,950 | 14,655,291 | 22,457,757 | 2,606,302 |
| | එකතුව | 27,823,700 | 21,517,811 | 20,471,954 | 11,492,384 | 22,798,616 | 21,737,458 | 29,851,415 | 5,000,480 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

**සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.5,000,480 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.11,492,384 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 130 ක් විය.**

### 2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

(i) **වර්ෂ ගණනාවක සිට රජයේ ආයතනවලින් අයවිය යුතු වරිපනම් රු.201,745 ක් අය කර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2018 ජූනි 30 දින වන විට රු.169,286 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

(ii) **2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.1,181,113 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.2,077,843 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟයෙන් හා බිල් කිරීම්වලින් අය කර තිබුණේ පිළිවෙළින් රු.380,716 ක් හා රු.527,597 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක් සහ 59 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට රු.1,169,530 ක හිඟ ශේෂයක් පැවතුණි. 2018 ජූනි 30 දින වන විට රු.987,139 ක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.**

(iii) **2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය තුළ වර්ෂ 10 කට පෙර සිට අයනොවී පවතින එහෙත්, වර්ෂයෙන් වර්ෂය බිල් කරමින් ඉදිරියට එන වරිපනම් ඒකක 67 කින් අයවිය යුතු වරිපනම් රු.389,022 ක් අය කර ගැනීමට හෝ අය නොවීමට හේතු සොයා බලා කටයුතු කර නොතිබුණි.**

(ආ) ජල බදු

**2017 ජනවාරි 01 දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.169,757 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂයෙන් අය කර තිබුණේ රු.49,200 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 30 ක් විය. මේ අනුව, හිඟ ජල ගාස්තු අය කර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.**

### 2.2.4 කුලී

(අ) **2017 ජනවාරි 01 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.924,264 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂයෙන් අය කර තිබුණේ රු.327,147 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 35 ක් විය. මේ අනුව, කඩ කුලී අය කර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.**

(ආ) වර්ෂයකට පෙර සිට ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 14 කඩහිමියාගෙන් රු.52,700 ක කඩ කුලියක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

-----------------

2017 ජනවාරි 01 දිනට හිඟ ත්‍රී රෝද රථ ගාස්තු ශේෂය රු.148,500 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.381,600 ක් විය. මින් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙලින් රු.30,900 ක් හා රු.145,200 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 21 හා සියයට 38 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට රු.354,000 ක හිඟ ශේෂයක් පැවති අතර, ආදායම් අය කිරීම දුර්වල මට්ටමක පැවතුණි. 2018 ජූනි 30 දිනට රු.211,200 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.352,163 ක් හා මුද්දර ගාස්තු රු.8,445,001 ක් විය. 2018 ජූනි 30 දින වන විට උසාවි දඩ රු.14,333 ක් හා මුද්දර ගාස්තු මුළු හිඟ මුදලම තවදුරටත් අය විය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------

සභා අරමුදලින් ඉටු කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා සමාලෝචිත වර්ෂයේ දී හඳුනා ගෙන 2017 මාර්තු 24 හා 29, අප්‍රේල් 02 හා මැයි 09 යන දිනයන්හිදි රු.6,970,000 ක වටිනාකමකට සකස් කළ සංවර්ධන යෝජනා 38 ක් අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර, 2017 ජූනි 30 හා ජූලි 11 යන දිනයන්හිදි අනුමත කරවා ගෙන තිබුණි. මේ ආකාරයෙන් ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා පූර්ව වර්ෂයේ දි හඳුනා නොගැනීමත්, අනුමත කිරීමට මාස 03 කට අධික කාලයක් ගත කිරීමත් යනාදි කරුණු මත ප්‍රාදේශීය සංවර්ධනය නිසි ලෙස ඉටු කිරීමට ඇති ඉඩකඩ බැහැර වී තිබුණි. මේ හේතුවෙන්, අනුමත කරන ලද සංවර්ධන යෝජනා 07 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

(i) සභා බලප්‍රදේශය තුළ වෙන් කිරීමකින් තොරව දෛනිකව එකතු කරන කසළ ටොන් 02 ක් පමණ කොම්පෝස්ට් නිෂ්පාදනය, ආරක්ෂිත දහනය හෝ නැවත භාවිතයට ගැනීම යනාදී ක්‍රමවේදවලින් සමන්විත කසළ කළමනාකරණයකින් තොරව උලපනේ පිහිටි පෞද්ගලික ඉඩමකට බැහැර කර පස් දමා වැසීම කර තිබුණි.

(ii) කසළ බැහැර කරනු ලබන භූමිය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රතිපාදන අරමුණුගත කාර්යයන් සඳහා වැය නොකිරීම

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05 කට වෙන් කර තිබූ රු.145,000 ක් අරමුණුගත කාර්යයන් ඉටුකර ගැනීමකින් තොරව මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණි. එසේම, වැය විෂයයන් 04 කට වෙන් කර තිබූ රු.190,000 ක ප්‍රතිපාදනවලින් වැය කිරීම සියයට 9.9 සිට සියයට 63.3 ක් දක්වා වූ අඩු මට්ටමක පවතින බවක් නිරීක්ෂණය විය.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

---

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන්, එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

(අ) 2003 නොවැම්බර් 18 දින ප්‍රාදේශීය සභාව මඟින් අනුමත කර තිබූ ගොඩනැගිලි සැලැස්මකට අනුකූලව බාහිර පාර්ශවයක් විසින් ඉදිකර තිබූ ගොඩනැගිල්ලක්, නොසැලකිලිමත්ව හා බලය අභිබවා කටයුතු කර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඇතුළු පිරිසක් 2008 ජුනි 21 දින අනවසර යැයි පවසා කඩා ඉවත් කිරීම හේතුවෙන්, අයිතිකරු විසින් පවරන ලද නඩුවක, නඩු තීරණය අනුව, රු.565,000 ක වන්දි මුදල්, නීතිඥ ගාස්තු හා වෙනත් වියදම් ලෙස රු.454,220 ක් ද සභා අරමුදලින් වැය කර තිබුණි. මේ සම්බන්ධව කරන ලද මු.රෙ.104(4) පරීක්ෂණයට අනුව, සභා අරමුදලට සිදු වූ පාඩුව හා දෙපාර්තමේන්තු ගාස්තු ඇතුළු රු.1,274,025 ක් හිටපු සභාපතිවරු දෙදෙනෙකුගෙන්, හිටපු ලේකම්වරයෙකු හා ආදායම් පරීක්ෂකවරයෙකුගෙන් අය කිරීමට නිර්දේශ ලබා දී ඇතත්, අදාළ පාඩුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 ඔක්තෝබර් 10 දින රු.2,100 ක ගාස්තු අය කර ජල පාරිභෝගිකයෙකු වෙත ජල නළ එළීම සඳහා මාර්ගය පළුදු කිරීමට ප්‍රාදේශීය සභාව අවසරය ලබා දී තිබුණි. එසේ වුවත්, පසුව සභාව විසින් නොසැලකිලිමත්ව හා බලය ඉක්මවා කටයුතු කර 2012 දෙසැම්බර් 04 දින එකී අවසරය අවලංගු කිරීම නිසා, සභාවට එරෙහිව අදාළ ජල පාරිභෝගිකයා විසින් පවරන ලද නඩුවකට අනුව, ජල නළ සැපයුම ලබා දීම සඳහා මාර්ගය පළුදු කිරීමේ නිර්දේශය නැවත ලබා දිය යුතු බවට නඩු තීරණය ලබා දී තිබුණි. ඒ පිළිබඳව වැය කළ මුදල් සම්බන්ධයෙන් කරන ලද මු.රෙ.104 පරීක්ෂණයකට අනුව සභා අරමුදලින් දරා ඇති නඩු ගාස්තු හා දෙපාර්තමේන්තු ගාස්තු සමඟ පාඩුව රු.112,500 ක් හිටපු සභාපති හා හිටපු සභිකයින් 10 දෙනෙකුගෙන් අය කිරීමට නිර්දේශ කර ඇතත්, අදාළ පාඩුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිදුව තිබූ රු.198,180 ක් වටිනා ගැල්වනයිස් බට 179 ක ඌනතාවය අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට හා විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

(අ) **2017** දෙසැම්බර් **31** දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී පුරප්පාඩු තනතුරු **16** ක් පැවතුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකුට විවිධ ක්ෂේත්‍ර රාජකාරී හා තවත් සංවර්ධන නිලධාරීන් **07** දෙනෙකුට විෂයය රාජකාරීවලට අමතරව සතියකට දින **02** ක් ක්ෂේත්‍රයෙහි යෙදීම සඳහා රාජකාරී පවරා තිබුණි. ඉදිරි වැඩසටහන්වල හා පසු වැඩසටහන්වල පොදු තොරතුරු රැස් කිරීම යනුවෙන් පමණක් රාජකාරී විස්තර දක්වා තිබීමෙන්, සංවර්ධන නිලධාරීන් **09** දෙනෙකු මෙසේ ක්ෂේත්‍රයේ වර්ෂය පුරා කෙරෙන රාජකාරී නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි විය. එසේම, ඔවුන්ගේ අධීක්ෂණ කටයුතු තවත් සංවර්ධන නිලධාරියෙකු වෙත පවරා දී ඇතත්, අධීක්ෂණය කළ ආකාරය හඳුනා ගත නොහැකි විය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

(අ) **1978** අංක **41** දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ **21** වගන්තිය ප්‍රකාරව, සැලසුම් අනුමත කර ගැනීම සඳහා **2014** සිට **2017** වර්ෂය දක්වා වූ කාලය තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් **536** කින් අයදුම්පත් **333** ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් **24** ක් සඳහා පමණි.

(ආ) කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක **29** කඩ කාමරය ගිවිසුමකින් තොරව බාහිර පුද්ගලයෙකු වෙත මාසිකව රු.**3,500** ක කුලී මුදලකට වාචිකව පවරා තිබුණි.

(ඇ) **2010** වර්ෂයේ දි ස්ථාපිත කර තිබූ ඇත්ගාල වෙළඳ සංකීර්ණය අංක **13** කඩ කාමරය **2017** දෙසැම්බර් **31** දින වන විටත් බඳු දීමට නොහැකිව වසා දමා තිබූ අතර, කඩ කාමර **07** ක් ගිවිසුම්ගත වීමකින් තොරව බාහිර පාර්ශවයන් වෙත කුලී පදනම මත දී තිබුණි.

(ඈ) ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවලට අදාළ එළඹී තිබූ ගිවිසුම්වල **06** වන වගන්තිය ප්‍රකාරව බදු කුලිය වර්ෂ **05** කට වරක් වැඩි වීමකට යටත්ව තක්සේරු කළ යුතු වුවත්, **2010**, **2011** හා **2012** වර්ෂවල දි ලබා දී තිබූ කඩ කාමර **05** ක කුලී සංශෝධනය කිරීමට **2017** දෙසැම්බර් **31** දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ **05** කට වරක් හෝ නව වරිපනම් තක්සේරුවක් ක්‍රියාත්මක කළ යුතු වුවත්, වර්ෂ **09** ක් ඉකුත් වී තිබියදීත් **2007** වර්ෂයේ වරිපනම් තක්සේරුව මතම **2017** වර්ෂයේදීත් වරිපනම් ගාස්තු අය කර තිබුණි.

(ඊ) **2011** සැප්තැම්බර් **27** දිනැති මහා සභාවේ තීරණයක් මත වරිපනම් බදු අය කළ හැකි දියුණු ප්‍රදේශ වශයෙන් ඒකක **3107** ක් හඳුනා ගෙන ඇතත්, එකී දේපළ සඳහා වරිපනම් බදු අය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(උ) කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර **34** ක් **2008** වර්ෂයේ දි ටෙන්ඩර් කර ගිවිසුම්ගත කාලය නිශ්චිතව දැක්වීමකින් තොරව "දිගුකාලීන" යනුවෙන් දක්වා ගිවිසුම්වලට එළඹ තිබුණි. එකී ගිවිසුමේ **06** වන වගන්තිය ප්‍රකාරව බදු කුලිය වර්ෂ **03** කට වරක් වැඩිවීමකට යටත්ව තක්සේරු කළ යුතු වුවත්, **2017** දෙසැම්බර් **31** දින වන විටත් කුලී සංශෝධනයක් කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

එකතුව රු.357,990 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක්, යතුරු පැදි 02 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි වාහන 01 ක් වර්ෂ 03 කටත් අධික කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

3.6 හඳුනාගත් පාඩු

------------------

2014, 2015 හා 2016 වර්ෂයන් හී මිල දී ගෙන තිබූ රු.112,420 ක් වටිනා කොන්ක්‍රීට් මායිම් කණු හා හියුම් පයිප්ප සඳහා යොදන කොලර් ඒකක 106 ක් හා වොට් 50 CFL බල්බ් 32 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතුණි.

3.7 ප්‍රසම්පාදනය

--------------

ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

රු.19,570,638 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 03 ක සියයට 15 සිට සියයට 31 දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 20 සිට සියයට 89 ක් දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | ---------- | ----------- |
| (අ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අය කර නොගැනීම |
| | | ii. කඩ කාමර කුලී තක්සේරු කර අය කර නොගැනීම |
| (ආ) | වත්කම් කළමනාකරණය | i. කඩ කාමර ගිවිසුම්ගත වීමකින් තොරව බදු දීම |
| | | ii. ඉඩම් සමීක්ෂණයක් සිදු නොකිරීම |
| | | iii. ඉඩම් ගිණුම්ගත නොකිරීම |
| (ඇ) | විවිධ තැන්පතු | i. කර්මාන්ත අත රැඳවුම් දිගු කාලයක් රඳවා තබා ගැනීම |
| | | ii. ආපසු ගෙවිය යුතු තැන්පතු පිළිබඳව සොයා බලා කටයුතු නොකිරීම |

| | | |
|---|---|---|
| (ඇ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | i. කසළ වෙන්කර භාර නොගැනීම<br>ii. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු නොකිරීම<br>iii. අවිධිමත්ව කසළ බැහැර කිරීම |